www.kidworship.kr

# දානියෙල්

– 29th Story–




212Page

පොතේ ගුරා — නෙබුකද්නෙශර් රජු මැරුණායින් පසුව බබිලෝනිය පාලනය කළේ
දාරියුස් නම් රජතුමාය. මේ දාරියුස් රජු, දානියෙල්ගේ උතුම් ප්‍රඥාවත්,
චරිතයත් සම්බන්ධව පැහැදී ඔහුව රටේ අග්‍රමාත්‍ය ධූරයට පත් කරනු
ලැබුවේය. නමුත් මේ ගැන රටේ සේවකයන් වෛරයෙන් සිටියේය.
දානියෙල්ගේ යම් දුර්වලකම් අල්ලා ගැනීමට, මේ සේවකයන් කොපමණ
උත්සහ කළත් ඔහුගේ වරදක්වත් දෝෂයක්වත් සම්බවුණේ නැත.
කොහොමද, මිනිසෙකුට මේ වගේ වෙන්න පුලුවන්. මෙතරම්

සේවකයන් — කඩවසම්, ලස්සන, ප්‍රියමනාප, ඥානවන්ත, ඒ වගේම අවංක...
ඔහ්... පුදුමයි..

................................................................................



213Page

මිනිසෙක් — ඔයා දානියෙල්ගේ රසිකයෙක් ද ?
දානියෙල්ව මෙතැනින් පිටමං කරන්න පුලුවන් කොහොමද කියා අපි
කල්පනා කරන්නට ඕන.
ම්... මගේ ළග හොඳ සැලැස්මක් තියෙනවා. බලමු.

1 සේවකයා — රජතුමනි ! ඔබට සේවය නොකර අන් දෙවිවරුන්ට සේවය කරන
මිනිස්සු මේ රටේ ඉන්නවා.

2 සේවකයා — එන්නා වූ දින 30 තුළ රජ්ජුරුවනි, ඔබට පමණක් නමස්කාර කළ යුතුයි
කියා ලියවිල්ලක් ඔබවහන්සේ ඉදිරිපත් කරන්නේ නම් මැනවි !!

3 සේවකයා — අපේ රාජ්‍යයේ.. රටේ රජ්ජුරුවන්වහන්සේට හැර, වෙන යම් දෙවි
කෙනෙකුට යමෙක් වඳින්නේ නම් ඔහු සිංහ ගුහාවට දැමිය යුතුයි.

................................................................................



214Page

පොතේ ගුරා — දාරියුස් රජතුමා මේ නියෝගය ලියා, ඔහුගේ මුද්‍රාව සහිතව සූදානම් කර,
පසුව සියලු ජනතාවට ඒ බව දැනුම් දුන්නේය.
මේ දැන්වීම ගැන ඇසූ දානියෙල් දිනකට තුන්වතාවක් දණින් හිඳ දෙවිය-
න්වහන්සේට කරමින් සිටි යාච්ඤාවේ, ස්තුතිදීමේ ක්‍රියාව නතර නොක-
රන්නට තීරණය කළේය.

1 සේවකයා — හ්හ්හා... මම හිතුවා හරියටම හරි. මගේ සිතුවිල්ල හරිය රජතුමනි.
දානියෙල් රටේ නීතියට විරුද්ධවයි ක්‍රියා කරන්නේ.
ඒ නිසා ඔහුව සිංහ ගුහාවට දැමිය යුතුයි.


................................................................................



215Page

පොතේ ගුරා — දාරියුස් රජුට දානියෙල් ගැන ඉතා ප්‍රියමනාපකමක්, ප්‍රේමයක් තිබුණ
නමුත් ඔහුට දානියෙල්ව සිංහ ගුහාවට දැමීම හැර වෙන කළ හැකි
දෙයක් ඉතුරුව තිබුණේ නෑ. දාරියුස් රජු දානියෙල්ට කතා කළා.

දාරියුස් රජු — දානියෙල්, ඔබ නමස්කාර කරන දෙවියන්වහන්සේම ඔබව බේරා ගන්නවා
ඇති.




216Page

**පොතේ ගුරා** — සිංහ ගුහාව තුළට දානියෙල්ව දැමුවා. නමුත් ඔහු දිගටම යාච්ඤාවේම යෙදී සිටියා. රජතුමා දානියෙල් ගැන ඉතා කණගාටුවෙන් කෑමවත්, නින්දවත් නොමැතිව රැය පහන් කළා.

පසුවදා උදෙන්ම දාරියුස් රජු සිංහ ගුහාව ළගට ඉක්මනින්ම ආවා.

.................................................................................



217Page

**දාරියුස් රජු** — දානියෙල්... දානියෙල් ඔයා නොකඩවම සේවය කරන නුඹේ දෙවියන්වහන්සේට සිංහයන්ගෙන් නුඹ ගලවන්ට පුලුවන් වී ද ?


**දානියෙල්** — ස්වාමීන්වහන්සේ, තමන්ගේ දූතයා එවා සිංහයන් මට අනතුරු නොකරන ලෙස උන්ගේ කටවල් පියවූ සේක.

**පොතේ ගුරා** — දානියෙල් සිංහ ගුහාව තුළ ඉතාම සමාදානයෙන් කිසි කලබලයක් නැතිව සිටියේය. නමුත් සිංහයන් බඩගිනිව දානියෙල් අසලම සිටියා.

රජතුමා ඉතාමත් සතුටට පත්වුණා.

දානියෙල්ව මෙසේ අනතුරට පත් කරන්නට කුමන්ත්‍රණය කළ සියලු දෙනාවත් ඔවුන්ගේ පවුල්වල අයත් සමග කෝපයට පත් දාරියුස් රජු ඔවුන් සියල්ලෝම සිංහ ගුහාවට හෙළන්නට නියම කළා.

.................................................................................



218Page

**1 සේවකයා** — ඌහ්... ඌහ්... බලන්න මේ, සිංහයා...

මම දැන් දෙවියන්වහන්සේ විශ්වාස කරනවා.

ඔව්. ඔව්. නෑ. නෑ. ආහ් ආහ් හ්..... අයියෝ බේර ගන්න.

**සේවකයන්** — නෑ නෑ නෑ..... ආහ්... ඌයි...අහ්...

(සිංහයන් ඔවුන්ගේ ඇට කැබල කළා)

**පොතේ ගුරා** — දාරියුස් රජු තමන්ගේ රාජ්‍යයේ අලුත් නියෝගයක් නිකුත් කළා.

" මගේ රාජ්‍යයේ ආණ්ඩුව, පවතින සෑම තැනම මනුෂ්‍යයන් දානියෙල්ගේ දෙවියන්වහන්සේ ඉදිරියේ වෙව්ලා භය වෙන හැටියට අණ කරමි " යනු ඒ නියෝගයයි.

.................................................................................

**ජීවිතයට අදාල කිරීම** — දුවේ පුතේ, .... කරනවා. දානියෙල් සමගම හිටි අය, හරිම නරක සිත් තිබුණ අය, එයාව සිංහ කූඩුවට දාන්න සැලසුම් කළා.

නමුත් දෙවියන්වහන්සේ දානියෙල් සමග සිටියා. ඔහුව බේරා ගත්තා.

අපිත් එක්ක ඉන්න සමහර අය, අපිට විරුද්ධව හරිම නපුරු වැඩ කරනවා නේද? ඔයාටත් එහෙම වෙලා තියෙනවාද? භය වෙන්න එපා. ඔයා යාච්ඤා කරන්න. දෙවියන්වහන්සේ අපි සමඟම ඉන්න නිසා අපිට කිසිම නරක දෙයක් වෙන්නේ නෑ.